# බරස්සර ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල චිනතාමානික්‍යවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. එක්තරා අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

කෝසල රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් සිත්ගෙණ පාසල්දනව්වේ ගමෙක අයපඬුරු ආදිය ලැබහෙණ සොරුන් හා එක්වගෙණ ඒ සොරුන්ට කියන්නෝ මම මනුෂ්‍යයන් ඇරගෙණ වනයට වදිමි තොපි ගම කොල්ලකා එයින් ලබනලද වසතුවෙන් මටත් භාගයක් දෙවයි කියා පළමු කොට මිනිස්සුන් රැස්කරවා තෙමේ වනයට ගොස් එහි ඉඳ සොරුන් අවුත් සරක් මරා මස් කා ගමපැහැර ගියකල්හි සවස්වේලේ මහජනයා විසින් පිරිවරණලදුව ගමට එන්නේය, ඔහුගේ ඒ ක්‍රියාව නොබෝ දවසකින්ම ප්‍රසිඬ විය. මනුෂ්‍යයෝ එපවත් රජ්ජුරුවන්ට දැන්නුය. රජ්ජුරුවෝ ඒ අමාත්‍යයා කැඳවා ගෙන්වාගෙණ දේ‍රහිඳුවා තරයේ නිග්‍රහකොට අනික් ගම්මුදලියෙකු ඒ පසල්දනව්වට යවා ජෙතවනයට ගොස් සර්‍වඥයන්වහන්සේට නමස්කාර කොට එකත්පස්ව හිඳ එපවත් දැන්වූය. බුදුරජානන්වහන්සේ මහරජ්ජුරුවෙනි මොහු මෙසේ කෙළේ දැන්මතු නොවෙයි පෙරත් මෙසේම කරණසුළුයයි වද්‍රා ඒ රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදළසේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදතතනම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි ඒ බරණැස් රජ්ජුරුවෝ එක් අමාත්‍යයක්හට ප්‍රත්‍යනත ජනපදයෙහි ගමක් දුන්නුය. මෙතැන්හි කියයුතුවූ සියල්ල පළමු කියනලද්ද හා සමානවන්නේය. එසමයෙහි බොධිසත්‍වයෝ වෙළද්‍රම්කොට ප්‍රත්‍යනත දනව්වෙහි වාසයකරන්නාහු ඒ අමාත්‍යයා ලත් ගම වාසයකරන්නාහුය. ඒ මහ බෝසතානෝ ඒ ග්‍රාමභොජකයා සවස්වේලෙහි පිරිවරා තදවූ ශබ්ද ඇති පටාභෙරියක් ගස්වාගෙණ එනකල්හි මේ දුෂ්ටවූ ග්‍රාමභොජකයා සොරුන් හා එක්වගෙණ ගම්පහරවා කොල්ලකවා සොරුන් පලාගොස් වනයට වන්කල්හි දැන් තෙමේ සානතද්‍රනත එක්කහුමෙන් නිවීසැනහී බෙර ගස්වාගෙණ එන්නේයයි නිඳ්‍රකළාහුය. නොබෝකලකින් ඔහුගේ ඒ ක්‍රියාව ප්‍රකාශ විය. රජ්ජුරුවෝ දේ‍රසානුරූපව නිග්‍රහකළාහුය. ශාසතෲවූ බුදුරජානන්වහන්සේ මහරජ්ජුරුවෙනි මොහු මෙබඳුවූ සවභාවඇත්තේ දැන්මතු නොවෙයි පෙරත් මෙබඳු සවභාව ඇත්තේවේදැයි මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා පූර්‍වාපරසනධිගළපා මේ බරස්සර ජාතකය නිමවා වද්‍රළසේක.

එසමයෙහි අමාත්‍යයා නම් දැන් මේ අමාත්‍යයාමය, එසමයෙහි අමාත්‍යයාට නිඳ්‍රකළාවූ ප්‍රාඥපුරුෂවූයෙමි. සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වද්‍රළසේක.